# ටෙන්ඩර් අයදුම්පත්‍රය

## කොළඹ මහා නගර සභාව – නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව

**<u>පොදු වෙළඳපොළවල හිස් මස් වෙළඳසැල් කුලී පදනම මත ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවීම.</u>**

**<u>2024/2025/2026 තෙවර්ෂය</u>**

<u>කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා</u>

පොදු වෙළඳපොළ නම සහ වෙළඳසැල් අංකය. ..........................................................................................

අයදුම්කරුගේ නම.....................................................................................................................

ලිපිනය ..........................................................................................................

..........................................................................................................

දුරකථන අංකය ..........................................................................................................

අයදුම්පත් ගාස්තුව රිසිට් අංකය ........................................................................ දිනය ......................................

ටෙන්ඩර් තැන්පත් ගාස්තුව ........................................................................... දිනය ....................................

නිකුත් කළ නිළධාරියා.........................................................................................

.....................................................................................

**නි.නා.භා/ගණකාධිකාරී/ ප්‍ර.ක.සේ.නි**

1. **පොදු වෙළඳපොළ නම** ..............................................................................................
2. **වෙළඳසැල් අංකය**.......................................................................................................
3. **වෙළඳ ස්වභාවය .** කුකුල් මස් / ගව මස් / එළු මස් / ඌරු මස්
4. **අයදුම්කරුගේ නම** ..................................................................................................
5. **ලිපිනය**.......................................................................................................................

   .......................................................................................................................
6. **ජාතික හැඳුනුම්පත් අංකය** ......................................................................................
7. **ටෙන්ඩර් මුදල(ඉලක්කමින්)** ......................................................................................
8. **ටෙන්ඩර් මුදල(අකුරින්)** ..........................................................................................

1. මා මෙම ටෙන්ඩරය ඉදිරිපත් කරනු ලබන්නේ මා වෙනුවෙන් විනා වෙනත් අයෙකුගේ නාමිකයෙකු හෝ නියෝජිතයෙකු වශයෙන් නොවන බව මා මෙයින් ප්‍රකාශ කර සිටිමි.

2. මා විසින් පිටු අංක 07 සිට 12 දක්වා වූ ටෙන්ඩරයේ කොන්දේසි හා උපදෙස් කියවා දැනුවත් වූ අතර, මා වෙත ටෙන්ඩරය ප්‍රදානය කරන ලද්දේ නම්, වර්ෂ 03 ක කාලයක් සඳහා මෙම කොන්දේසි වලට අදාලව, ඒවායින් සම්පුර්ණයෙන්ම බැඳීමට මාගේ කැමැත්ත ප්‍රකාශ කර සිටිමි.

3. මෙම ටෙන්ඩර් කටයුත්තට අදාලව අවසාන තීරණය ගැනීම කොළඹ මහා නගර සභාව සතු බව මා දැනුවත් බව ද, ඊට එකඟ බව ද ප්‍රකාශ කරමි.

4. මා විසින් මෙම ටෙන්ඩරයෙහි ලබා දී ඇති සියලු තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මා සහතික කරන අතර, මා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සාවද්‍ය වන්නේ නම්, එය මාගේ ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට හේතුවන බව මම හොඳාකාරව දනිමි.

ටෙන්ඩර්කරුගේ අත්සන ..........................................................................................

දිනය ..............................................................

<u>සාක්ෂි</u>

1. ..........................................................

(අත්සන)

නම ..........................................................................................................

ලිපිනය ..........................................................................................................

..........................................................................................................

2. ..........................................................

(අත්සන)

නම ..........................................................................................................

ලිපිනය ..........................................................................................................

..........................................................................................................

# කොළඹ මහා නගර සභාව

## නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව

### නාගරික පොදු වෙළඳපොළ මස් වෙළඳසැල්

### කුලී පදනම මත පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවීම

## පටුන


1. ටෙන්ඩර් කිරීමට නියමිත වෙළඳසැල් උපලේඛනය............................ පිටු අංක 04-06
2. ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කිරීම............................................................ පිටු අංක 07
3. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්........................................... පිටු අංක 08
4. ටෙන්ඩර් ඇගයීම.......................................................................................... පිටු අංක 09
5. ටෙන්ඩරය පිරිනැමීම.................................................................................... පිටු අංක 10
6. වාරික මුදල් ගෙවීම...................................................................................... පිටු අංක 11
7. සාමාන්‍ය කොන්දේසි.................................................................................... පිටු අංක 11
8. විශේෂ කරුණු.............................................................................................. පිටු අංක 12

## 1. Borella Market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | **7B/26** | **BEEF** | 180,000.00 | 90,000.00 |
| 2 | **7B/27** | **CHICKEN** | 303,400.00 | 151,700.00 |
| 3 | **7B/28** | **CHICKEN** | 525,700.00 | 262,850.00 |
| 4 | **7B/29** | **BEEF** | 300,000.00 | 150,000.00 |
| 5 | **7B/30** | **BEEF** | 180,000.00 | 90,000.00 |
| 6 | **7B/31** | **MUTTON** | 223,100.00 | 111,550.00 |
| 7 | **7B/35** | **BEEF** | 180,000.00 | 90,000.00 |
| 8 | **7B/36** | **CHICKEN** | 400,000.00 | 200,000.00 |
| 9 | **7B/37** | **BEEF** | 280,900.00 | 140,450.00 |
| 10 | **7B/38** | **CHICKEN** | 450,500.00 | 225,250.00 |
| 11 | **7B/41** | **BEEF** | 526,800.00 | 263,400.00 |
| 12 | **7B/42** | **BEEF** | 300,000.00 | 150,000.00 |
| 13 | **7B/43** | **MUTTON** | 190,000.00 | 95,000.00 |
| 14 | **7B/55** | **PORK** | 140,000.00 | 70,000.00 |

## 2.Deens road Market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | **44/03** | **BEEF** | 207,900.00 | 103,950.00 |
| 2 | **44/04** | **CHICKEN** | 274,500.00 | 137,250.00 |
| 3 | **44/05** | **BEEF** | 150,000.00 | 75,000.00 |
| 4 | **44/06** | **BEEF** | 175,000.00 | 87,500.00 |
| 5 | **44/07** | **MUTTON** | 370,500.00 | 185,250.00 |
| 6 | **44/08** | **BEEF** | 167,100.00 | 83,550.00 |
| 7 | **44/09** | **BEEF** | 183,500.00 | 91,750.00 |
| 8 | **44/10** | **BEEF** | 150,000.00 | 75,000.00 |
| 9 | **44/11** | **MUTTON** | 379,800.00 | 189,900.00 |
| 10 | **44/12** | **BEEF** | 100,000.00 | 50,000.00 |
| 11 | **44/14** | **BEEF** | 100,000.00 | 50,000.00 |
| 12 | **44/15** | **CHICKEN** | 270,900.00 | 135,450.00 |

## 3. Kollupitiya Market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | **1** | **CHICKEN** | 942,700.00 | 471,350.00 |
| 2 | **2** | **CHICKEN** | 600,000.00 | 300,000.00 |
| 3 | **3** | **MUTTON** | 520,000.00 | 260,000.00 |
| 4 | **4** | **BEEF** | 1,154,300.00 | 577,150.00 |
| 5 | **9** | **MUTTON** | 540,000.00 | 270,000.00 |
| 6 | **10** | **BEEF** | 800,000.00 | 400,000.00 |
| 7 | **11** | **MUTTON** | 621,800.00 | 310,900.00 |
| 8 | **12** | **BEEF** | 841,400.00 | 420,700.00 |
| 9 | **13** | **CHICKEN** | 1,107,500.00 | 553,750.00 |
| 10 | **01A** | **PORK** | 120,100.00 | 60,050.00 |

## 4. Bambalapatiya Market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | **13** | **CHICKEN** | 722,800.00 | 361,400.00 |
| 2 | **14** | **CHICKEN** | 600,000.00 | 300,000.00 |
| 3 | **21** | **BEEF** | 220,000.00 | 110,000.00 |
| 4 | **22** | **BEEF** | 250,000.00 | 125,000.00 |
| 5 | **23** | **MUTTON** | 345,100.00 | 172,550.00 |
| 6 | **24** | **BEEF** | 500,000.00 | 250,000.00 |
| 7 | **25** | **BEEF** | 550,000.00 | 275,000.00 |

## 5. Wellawatta Market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | 1 | BEEF | 550,000.00 | 275,000.00 |
| 2 | 2 | BEEF | 550,000.00 | 275,000.00 |
| 3 | 3 | BEEF | 764,600.00 | 382,300.00 |
| 4 | 4 | BEEF | 675,900.00 | 337,950.00 |
| 5 | 1 | MUTTON | 698,000.00 | 349,000.00 |
| 6 | 2 | MUTTON | 516,400.00 | 258,200.00 |
| 7 | 3 | MUTTON | 420,000.00 | 210,000.00 |
| 8 | 1 | CHICKEN | 2,100,000.00 | 1,050,000.00 |
| 9 | 2 | CHICKEN | 2,100,000.00 | 1,050,000.00 |
| 10 | 3 | CHICKEN | 1,975,000.00 | 987,500.00 |
| 11 | 1 | PORK | 77,000.00 | 38,500.00 |

## 6.Maligawatta Market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | 1 | CHICKEN | 1,949,600.00 | 974,800.00 |
| 2 | 2 | MUTTON | 201,000.00 | 100,500.00 |
| 3 | 3 | CHICKEN | 1,859,300.00 | 929,650.00 |
| 4 | 4 | BEEF | 173,700.00 | 86,850.00 |
| 5 | 5 | BEEF | 266,300.00 | 133,150.00 |
| 6 | 6 | BEEF | 367,100.00 | 183,550.00 |
| 7 | 7 | BEEF | 120,000.00 | 60,000.00 |
| 8 | 8 | BEEF | 385,600.00 | 192,800.00 |
| 9 | 9 | BEEF | 211,500.00 | 105,750.00 |
| 10 | 11 | CHICKEN | 1,787,500.00 | 893,750.00 |

## 7.Dematagoda Market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | 50/37 | CHICKEN | 240,000.00 | 120,000.00 |
| 2 | 50/03 | BEEF | 800,000.00 | 400,000.00 |
| | | | | |

## 8. Jathikapola Market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | 275 | BEEF | 139,000.00 | 69,500.00 |
| 2 | 277 | MUTTON | 84,700.00 | 42,350.00 |
| 3 | 279 | CHICKEN | 613,700.00 | 306,850.00 |

## 9.Jinthupitiya Market

| | Number | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | 1 | MUTTON | 959,400.00 | 479,700.00 |
| 2 | 3 | MUTTON | 850,000.00 | 425,000.00 |
| 3 | 6 | CHICKEN | 425,000.00 | 212,500.00 |
| 5 | 7 | MUTTON | 850,000.00 | 425,000.00 |

## 10. Vystwicke market

| | Number | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | 30/2 | CHICKEN | 1,719,200.00 | 859,600.00 |
| 2 | 30/4 | BEEF | 452,300.00 | 226,150.00 |
| 3 | 30/5 | MUTTON | 154,800.00 | 77,400.00 |
| 4 | 30/6 | BEEF | 393,900.00 | 196,950.00 |

## 11. Nagalagam st market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | (381/2) | CHICKEN | 769,900.00 | 384,950.00 |
| 2 | (381/6) | MUTTON | 248,400.00 | 124,200.00 |
| 3 | (381/3) | BEEF | 248,400.00 | 124,200.00 |
| 4 | (381/4) | BEEF | 269,500.00 | 134,750.00 |
| 5 | (381/5) | BEEF | 200,000.00 | 100,000.00 |
| 6 | 381/7 | CHICKEN | 700,000.00 | 350,000.00 |
| 7 | 381/8 | PORK | 190,000.00 | 95,000.00 |
| 8 | (381/1) | CHICKEN | 700,000.00 | 350,000.00 |

## 12.Slave Island Market

| | Number | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | 1 | MUTTON | 200,000.00 | 100,000.00 |
| 2 | 2 | BEEF | 300,000.00 | 150,000.00 |
| 3 | 3 | BEEF | 250,000.00 | 125,000.00 |
| 4 | 4 | BEEF | 250,000.00 | 125,000.00 |
| 5 | 5 | CHICKEN | 300,000.00 | 150,000.00 |

## 13. Kirulapone Market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | 103 | PORK | 193,700.00 | 96,850.00 |
| 2 | 125 | CHICKEN | 6,143,700.00 | 3,071,850.00 |
| 3 | 145 | CHICKEN | 7,691,600.00 | 3,845,800.00 |
| 4 | 146 | CHICKEN | 5,500,000.00 | 2,750,000.00 |
| 5 | 147 | MUTTON | 1,643,900.00 | 821,950.00 |
| 6 | 148 | BEEF | 2,566,700.00 | 1,283,350.00 |
| 7 | 149 | BEEF | 2,000,000.00 | 1,000,000.00 |
| 8 | 150 | BEEF | 2,298,900.00 | 1,149,450.00 |

## 14. Kotahena Market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | 11 | BEEF | 353,300.00 | 176,650.00 |
| 2 | 13 | BEEF | 200,000.00 | 100,000.00 |
| 3 | 14 | MUTTON | 274,500.00 | 137,250.00 |
| 4 | 17 | MUTTON | 299,400.00 | 149,700.00 |
| 5 | 18 | CHICKEN | 772,300.00 | 386,150.00 |
| 6 | 19 | CHICKEN | 776,900.00 | 388,450.00 |

## 15. Modara Market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | 4 | BEEF | 237,600.00 | 118,800.00 |

## 16. Kosgashandiya Market

| | Shop | Nature | Tender price | Tender Deposit |
|---|---|---|---|---|
| 1 | 10/04 | CHICKEN | 450,000.00 | 225,000.00 |
| 2 | 10/8 | BEEF | 531,500.00 | 265,750.00 |
| 3 | 10/09 | BEEF | 523,400.00 | 261,700.00 |
| 4 | 10/10 | MUTTON | 517,100.00 | 258,550.00 |
| 5 | 10/11 | BEEF | 450,000.00 | 225,000.00 |
| 6 | 10/12 | BEEF | 614,800.00 | 307,400.00 |

**කොළඹ මහ නගර සභාව**

**නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුව**

කොළඹ මහා නගර සභාවට අයත් පොදු වෙළඳපොළවල හිස් ව පවතින, මේ සමඟ අමුණා ඇති උපලේඛනයෙහි දැක්වෙන වෙළඳසැල් **වසර 03 ක කාලයක් සඳහා**, කුලී පදනම මත ලබා දීම සඳහා මුද්‍රා තබන ලද පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් අයදුම්පත්‍ර නිකුත් කිරීම

2023.10.04 සිට 2023.10.24 දින පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා ටෙන්ඩර් ලියවිලි ( මුල් පිටපත හා අනු පිටපත) දෙආකාරයකින් ලබා ගත හැක.

**ක්‍රමය 01 – පුරහල ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගැනීම**

- කොළඹ මහා නගර සභාවේ කොළඹ 07, පුරහල පරිශ්‍රයේ පිහිටි නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවේ ආදායම් අංශය වෙත සතියේ වැඩකරන දිනවල පෙ.ව.9.00 ත් ප.ව.3.00 අතර ලිඛිත ඉල්ලීමක් ලබා දී අයදුම්පත්‍ර ගාස්තුව වන රු **5,750.00** ක් ගෙවීමෙන් ටෙන්ඩර් ලියවිලි ලබා ගත හැකිය.

**ක්‍රමය 02 – කොළඹ මහා නගර සභාවේ www.colombo.mc.gov.lk නිල වෙබ් අඩවියෙන් බාගත කර ගැනීම.**

I. අයදුම්පත්‍ර ගාස්තුව වන රු 5,750.00.00 ක මුදල පහත දෙ ආකාරයෙන් ගෙවිය හැකිය.

a) මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් , පුරහල ශාඛාවේ ගිණුම් අංක 167-1-001-6-3169425 වෙත බැර කිරීම.

b) **කොළඹ මහා නගර සභා සීමාව තුල පිහිටි සියළු දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රවල ගෙවීම් කවුළු වෙත සතියේ දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා ගෙවීම් කිරීම.**

c) ටෙන්ඩර් තැන්පතුව අනිවාර්යයෙන්ම නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවේ ආදායම් අංශය වෙත මුදලින් ගෙවිය යුතුය.

d) ටෙන්ඩර් ලියවිලි සමග මුදල් ගෙවූ ලදුපත අමුණා ඉදිරිපත් කිරිම අනිවාර්යය වේ.

ටෙන්ඩර් විවෘත කිරිම

1. **2023.10.25 දින ප.ව 3.00 ට ටෙන්ඩර් තැන්පතු ගෙවීම අවසන් වන අතර**, නියමිත පරිදි සම්පූර්ණකර මුද්‍රා තබන ලද මුල් පිටපත සහ අනු පිටපත සහිත අයදුම්පත 2023.10.26 දින පෙ.ව 10.00 ට පෙර කොළඹ 07, පුරහල පරිශ්‍රයේ නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය.
2. 2023.10.26 දින පෙ.ව. 10.00 ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් වේ. ඉන් අනතුරුව වහාම නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් විවෘත කිරීම සිදු කරනු ලබන අතර ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගී විය හැකිය.
3. මේ සම්බන්ධව වැඩි විස්තර කොළඹ 07, කොළඹ මහා නගර සභාවේ නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික (ආදායම්) වෙතින් ලබා ගත හැකිය. දු.අංක - 011-2692465

## <u>3. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්</u>

1. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි දැක්වෙන සම්පූර්ණ නම සහ වර්තමාන ලිපිනය අනිවාර්යයෙන් ඉදිරිපත් ඉදිරිපත් කළ යුතුය.

2. එක් එක් වෙළඳසැල සඳහා වන අවම ටෙන්ඩර් මුදල පිටු අංක 04-06 හි ඇති උපලේඛනයෙහි එක් එක් වෙළඳසැල ඉදිරියෙන් දක්වා ඇත.

3. නියමිත අයදුම්පත්‍රය කළු හෝ නිල් කාබන් පෑනක් භාවිතයෙන් පමණක් සම්පූර්ණ කළ යුතු අතර, කිසියම් වෙනස්කමක් කිරීමට අවශ්‍ය වන්නේ නම් අදාල ස්ථානය තනි ඉරකින් කපාහැර, එහි තම කෙටි අත්සන යෙදිය යුතුය.කිසිඳු හේතුවක් මත පැන්සල් හා මකන දියර භාවිතයෙන් වැළකිය යුතුය.

4. පෝරමයෙහි ටෙන්ඩර් මුදල **<u>ඉලක්කමින් සහ අකුරින්</u>** යන දෙයාකාරයෙන්ම ඇතුලත් කල යුතු අතර, එහිදී ඉලක්කම් සහ අකුරු අතර කිසියම් නොගැලපීමක් පැවතියහොත් **අකුරින් සඳහන් කර ඇති මුදල** ටෙන්ඩර් මුදල් ලෙස පිළිගනු ලැබේ.

5. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරු විසින් පෞද්ගලිකව සම්පූර්ණ කර අත්සන් තබා තිබිය යුතුය.

6. සෑම ටෙන්ඩර් අයදුම්පත්‍රයක් ම **<u>මුල් පිටපත සහ අනු පිටපත</u>** වශයෙන් වෙන් වෙන් ව කවර වල දැමීම සිදුකළ යුතු අතර, එම කවර දෙක නැවත එක් කවරයක බහා **නාගරික කොමසාරිස් , කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්වීම හෝ නාගරික ලේකම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

7. එකී ලියුම් කවරයෙහි වම් පස ඉහල කෙළෙවරහි ඉල්ලුම් කරනු ලබන **වෙළඳ සැල් අංකය සහ වෙළඳ පොළෙහි නම** පැහැදිලිව සඳහන් කිරීම අනිවාර්යය වන අතර, සෑම ලිපි කවරයකම ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ද පැහැදිලිව සඳහන් කළ යුතුය.

**8. අයදුම්පත සමග පහත ලියවිලි ඉදිරිපත් කළ යුතුය.**

   1. තැන්පතු මුදල ගෙවන ලද රිසිට් පතේ මුල් පිටපත.
   2. අයදුම්පත් ගාස්තු ගෙවනලද රිසිට් පතේ මුල් පිටපත.
   3. ටෙන්ඩර්කරුගේ ලිපිනය තහවුරු කිරීම සඳහා ලියවිල්ලක්.
   4. ජාතික හැඳුනුම්පතේ පිටපතක්.

## 4. <u>ටෙන්ඩර් ඇගයීම</u>

1. එක් එක් වෙළඳසැල සඳහා ටෙන්ඩරය ලබා දෙනු ලබන්නේ ලැබී ඇති ඉහලම ටෙන්ඩර් මිළටය.

2. අසම්පූර්ණ හෝ අවශ්‍ය ලියවිලි ඉදිරිපත් නොකරන ලද අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. සෑම ටෙන්ඩරයක් සඳහා ම අයදුම්පතෙහි අමුණා ඇති උප ලේඛනයෙහි ඇති එක් එක් වෙළඳ සැල ඉදිරියෙහි සඳහන් කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල, මුදලින් ගෙවා ඊට අදාල ලදුපතේ මුල් පිටපත ඇමිණිය යුතුය. **<u>මේ සම්බන්ධව කිසියම් කඩකිරීමක් සිදුවුවහොත් එය ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත.</u>**

4. මින් පෙර මීට අදාලව කොළඹ මහා නගර සභාව සමග වූ ටෙන්ඩර් ගිවිසුම් උල්ලංඝනය කරන ලද පුද්ගලයන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ටෙන්ඩර් කොන්දේසි කඩ කරමින් ඉදිරිපත් කර ඇති ඕනෑම ටෙන්ඩරයක් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. මෙම ටෙන්ඩරය ඉදිරිපත් කරන්නේ අවංක චේතනාවකින් නොවන බවට එත්තු ගියහොත් හෝ එවැනි ටෙන්ඩරයක් කොළඹ මහා නගර සභාවේ ඕනෑම වෙළඳපොළක හෝ එවැනි ස්ථානයක ලබාදීම සභාවේ මතයට අනුව ටෙන්ඩර්කරුගේ චරිතය හා ක්‍රියා පිළිවෙත් අනුව සුදුසු නොවන බව පෙනී ගියහොත් ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සභාව තබා ගන්නා අතර, එවැනි ප්‍රතික්ෂේප කිරීමක් පිළිබඳව හේතු දැක්වීමට සභාව බැඳී නොසිටී.

6. ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනිමේ හෝ ප්‍රතික්ෂේප කිරිමේ අවසාන තීරණය සභාව සතුවන අතර එයට සියළු කරුණු බැඳී පවතී.

## 5. <u>ටෙන්ඩරය පිරිනැමීම</u>

1. ඉදිරිපත් කරන ලද ටෙන්ඩරය සාර්ථක ද ,අසාර්ථක ද යන්න ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

2. සාර්ථක ටෙන්ඩර්කරු බව දැනුම් දීමෙන් පසු දින 07 ක් තුල පළමු වාරික මුදල ද, විදුලි බිල්පත් නොගෙවා හිඟ මුදල් ඇතිවිට ඒවා අයකර ගැනීමට හැකිවන සේ රු. 50,000.00 ක ඇප තැන්පතුවක් ද, ගෝඝාතක බලපත්‍රගාස්තු රු 100.00 ද (කුකුල් මස් වෙළඳසැල් හැර) කොළඹ මහා නගර සභාව වෙත ගෙවිය යුතුය.

3. මෙම නිවේදනයෙහි අවශ්‍යතාවයන්ට තරයේම අනුගත වෙමින් ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට ප්‍රථම වලංගු ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද නමුත් තම ටෙන්ඩරය පිලිගෙන නොමැති සියලු පුද්ගලයින්ට ටෙන්ඩරය සඳහා ලබාදී ඇති තැන්පතුව ආපසු ලබා ගැනීමට හිමිකම ඇත.

4. **සාර්ථක ටෙන්ඩර් කරුවකු අදාල ටෙන්ඩරය භාර නොගන්නේ නම්, ඊට අදාල තැන්පතු මුදල ආපසු ලබාගැනීමට හිමිකම් නොලබයි**.

5. **ටෙන්ඩර් කාලය අවසන් වීමට ප්‍රථම, වෙළඳසැල හැර යන පුද්ගලයන්ගේ ටෙන්ඩර් තැන්පතුව කුමන හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලැබේ**.

6. මෙම තැන්පතු මුදල ආපසු ලබා ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කිරීමෙන් පසු **<u>මාස 06 ක් තුල</u>** ඉල්ලා සිටිය යුතුය. එම කාලය තුල ඉල්ලීම් ඉදිරිපත් නොවන සියළු තැන්පතු ආදායම වෙත බැර කරනු ලබන අතර , ආපසු ගෙවන ලෙස පසුව කරනු ලබන ඉල්ලීම් පිළිබඳව සලකා බලනු නොලැබේ.

7. මෙම මුදල ආපසු ගෙවීම සඳහා පහත ලියවිලි ඉදිරිපත් කළ යුතුය.
   1. තැන්පතු මුදල ආපසු ගෙවන ලෙස ඉල්ලීමක් සහිත ලිපියක්.
   2. තැන්පතු මුදල ගෙවූ රිසිට්පතේ පිටපතක්.
   3. ජාතික හැඳුනුම්පතේ පිටපතක්.
   4. ටෙන්ඩර්කරුගේ බැංකු විස්තර සහිත පාස් පොතක පිටපතක් හෝ බැංකු ප්‍රකාශනයක පිටපතක්.

8. ටෙන්ඩර් තැන්පතු මුදල ගෙවීමෙන් පසු වෙළඳසැල ආරම්භ කිරීම ප්‍රමාද කිරීම මත පැන නගින සියළු ගැටළු හා අලාභ කුලී කරු විසින් ම දරා ගත යුතු අතර, කිසිඳු හේතුවක් මත විවෘත නොකරන ලද වෙළඳසැලක ටෙන්ඩර් මුදල ආපසු ගෙවනු නොලැබේ.

## 6. <u>වාරික මුදල් ගෙවීම</u>

1. වර්ෂයට අදාල වන ටෙන්ඩර් වටිනාකම පෙර වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට පෙර එක් වාරිකයක් සහ අදාල වර්ෂයේ මාර්තු 31 දිනට එක් වාරිකයක් වශයෙන් **<u>සමාන වාරික දෙකකින්</u>** සම්පූර්ණයෙන් ගෙවා නිමකළ යුතුය. **දෙවෙනි සහ තුන්වන වර්ෂවලදී,පෙර වර්ෂයේ ටෙන්ඩර් මුදලට 5% ක මුදලක් සමග ඊළඟ වර්ෂයේ ටෙන්ඩර් මුදල ගණනය කරනු ලබන අතර, එය ආසන්නතම දහසේ අගයට වටයනු ඇත.**

2. මෙම දිනය (අදාල මාසයේ 31 දින ) නිවාඩු දිනයකට යෙදුනහොත් අවසාන රාජකාරි දින හෝ ඊට ප්‍රථම ගෙවිම කළ යුතුය. අදාල දිනට ගෙවිය යුතු වාරික මුදල් ගෙවීම ට කටයුතු නොකරනු ලබයි නම්, ඊළග මස 01 දින වෙළඳ සැල මුද්‍රා තබනු ලබන අතර, අදාල වෙළඳසැල වෙනුවෙන් රඳවා ඇති ටෙන්ඩර් තැන්පතුව ද ආදායම වෙත බැර කරනු ලැබේ.

3. පෞද්ගලිකව විදුලිය ලබාගෙන නොමැති, පොදු මනුව යටතේ විදුලිය සහ ජලය ලබා ගන්නා වෙළඳසැල් සඳහා **<u>මාසික ව රු12,000.00 විදුලි ගාස්තුවක් සහ රු 5,000.00 ක ජල ගාස්තුවක්</u>** අයකරන අතර, එය සෑම මාසයකම 15 වන දිනට පෙර නාගරික පශු වෛද්‍ය දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුය. සියළු වෙලදසැල් වලට අදාල ජල විදුලි බිල්පත් මාස 03 කට වරක් පියවා එහි පිටපත් වෙළඳසැල් පරිපාලක වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් නොකරන සියළුම වෙළඳසැල් මුද්‍රා තැබීමට කටයුතු කරනු ලැබේ.

## 7. <u>සාමාන්‍ය කොන්දේසි</u>

1. ටෙන්ඩරය සඳහා කලින් කලට අවශ්‍ය වන කොන්දේසි කිසිවක් වෙතොත් ඒවා පැනවීමේ අයිතිය සභාව රඳවා ගන්නා අතර එසේ පනවනු ලබන අමතර කොන්දේසි වලට ටෙන්ඩර්කරු බැදෙනු ඇත.

2. සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන අවශ්‍යතාවයන්ට සහ කොන්දේසි වලට ටෙන්ඩර්කරු අනුගත විය යුතුය.

3. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර, තමා ටෙන්ඩර් ඉදිරිපත් කරන වෙළඳසැලෙහි භෞතික තත්වය හා අනෙකුත් පහසුකම් පිලිබඳව හා තමා ටෙන්ඩර් කරන වෙළඳපොළෙහි තත්වය පිළිබද ව ද , ටෙන්ඩර්කරුවන්ට අවබෝධයක් තිබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

4. භෞතිකව වෙළඳසැල පරික්ෂාකිරීමෙන් අනතුරුව එහි පවත්නා තත්වය පැහැදිලි අවබෝධයකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර ම වෙළඳසැලෙහි සිදුකළ යුතු අළුත්වැඩියා කිරීම් වෙළඳසැල ලබා ගන්නා පුද්ගලයා විසින් ම සිදුකරගත යුතු ය.

5. ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු කිසිදු හේතුවක් මත ටෙන්ඩර් මුදල් හෝ අළුත්වැඩියා වියදම් ආපසු ගෙවීමක් හෝ කුලී සංශෝධනයක් හෝ වෙනත් ආකාරයේ වූ අලාභ හෝ වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් හෝ අඩුකිරීමක් සඳහා ඉල්ලුම් කිරීමට ටෙන්ඩර්කරුට හිමිකමක් නැත.

6. තමන්ට ලබා දී ඇති වෙළඳපොළවල් වල වෙළඳාම් කිරීමේදී සභාවේ අතුරු ව්‍යවස්ථා , පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත හෝ අදාල වන යම් නීතියක් යටතේ වන කිසියම් වරදක් සඳහා අධිකරණයන් මගින් වැරදිකරු කර තිබෙනවානම් එවැනි පුද්ගලයෙකු කර ඇති කුලී පැවරීම අවලංගු කරනු ඇත.

7. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු වෙත කරන ලද පැවරීමක් වෙනත් අයෙකුට මාරු කළ නොහැකි අතර කිසිදු හේතුවක් මත තෙවන පාර්ශවයක් වෙත ලබා දීම නොකළ යුතුය .

8. ටෙන්ඩර්කරු විසින් සිය වෙළඳපොළ ටෙන්ඩරය පිළියෙළ කිරීමේදී හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් ටෙන්ඩර්කරුට දැරීමට සිදුවන කිසිදු වියදමක් සම්බන්ධයෙන් සභාවෙහි වගකීමක් නොමැත.

**8. <u>විශේෂ කරුණු</u>**

ටෙන්ඩර් ලියවිලි ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවෙන් සිට ටෙන්ඩර් තැන්පතුව ගෙවීමෙන් පසු ටෙන්ඩර් ලියවිලි ඉදිරිපත් නොකිරීමට තීරණය කර ඇති හා ටෙන්ඩර් බාර ගැනීම අවසන් කිරීමට ප්‍රථම ටෙන්ඩර් පෙට්ටියට තැන්පතු රිසිට් පත ඇතුලු සියළු ටෙන්ඩර් පත් බහා නොමැති ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් තැන්පතුව ආපසු ලබාගැනීමට හිමිකම් ඇත.

**නාගරික කොමසාරිස්**
**කොළඹ මහා නගර සභාව**